මගේ අංකය : JSC/SEC/CIR/2021

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක:- 444

සියලුම
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/ මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන් /මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් හමුවීමේ දිනය සඳුදා ලෙස සංශෝධනය කිරීම.</u>**

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2014.06.09 දිනැති චක්‍රලේඛ අංක 372 හා 2020.05.13 දිනැති අංක JSC/SEC COR: 06 චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/GPA/Circular/29/2020 හා 2020.09.15 දිනැති චක්‍රලේඛය අනුව සියලුම රාජ්‍ය ආයතන වල මහජන දිනය ලෙසට සඳුදා දිනය නම් කර ඇති බැවින්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2020.05.13 දිනැති අංක JSC/SEC COR: 06 දරණ චක්‍රලේඛය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව නැවත දැනුම් දෙන තුරු පහත පරිදි කටයුතු කල යුතු බව මෙයින් දන්වමි.

I. අදාල නිලධරයා /නිලධාරිනිය විසින් සිය අභියාචනා/ඉල්ලීම් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව 0112-446111 ෆැක්ස් අංකය මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත මුලින්ම යොමු කළ යුතුය.

II. එලෙස ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් එකී නිලධරයාට/ නිලධාරිනියට තව දුරටත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්ට පුද්ගලිකවම කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් පමණක්, ඒ සඳහා 0112-433119 දුරකථන අංකයට ඇමතුමක් ලබාදී ලියාපදිංචි විය යුතුය.

III. එසේ ලියාපදිංචි වීම සඳහා සතියේ <u>බදාදා හෝ බ්‍රහස්පතින්දා</u> දිනයන්හි අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ඩබ්ලිව්.එම්.නිලන්ති ෂාමනී මෙනවිය වෙත දුරකථන ඇමතුමක් ලබාදී ඒ සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කර ගත යුතුය.

IV. ඒ අනුව අවශ්‍යතාවය සලකා බලා එක් නිලධරයෙකුට/ නිලධාරිනියකට සතියේ **<u>සඳුදා</u>** දිනක විනාඩි 05 ක උපරිම කාලයක් දුරකථයෙන් අදාල ගැටළුව සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිලධරයෙකු සමඟ සාකච්ජා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීමට කටයුතු කරනු ඇත.

02. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉහත සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජය විසින් ඉදිරිපත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ නිර්නායක අනුව බව අවධාරණය කරන අතර ඒ පිළිබඳව ඔබගේ අධිකරණයේ සේවය කරනු ලබන සියලුම උපලේඛනගත රජයේ නිලධරයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමි.

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 ජනවාරි මස 21 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.